# කරුණා පිපිර වූ ප්‍රභාකරන් මිථ්‍යාව

ප්‍රභාකරන් හා කරුණා අතර ඇති වී තිබෙන ගැටුම හේතුවෙන් මෙරට දේශපාලනයෙහි දෙමළ ජාතිවාදය වටා ගොඩනගා ඇති මිථ්‍යා රාශියක් බිඳවැටෙයි. කරුණා ප්‍රභාකරන්ට විරුද්ධ ව සටන් කරන්නේ තමන්ගේ ශක්තියෙන් පමණක් ද නැත්නම් ඉන්දියාවේ හෝ වෙනත් රටක ආධාරයෙන් ද යන්න පැහැදිලි නැති වුවත් අනිවාර්යයෙන් ම මේ කෙරෙන්නේ ප්‍රභාකරන්ගේ ආධිපත්‍යයට විරුද්ධ සටනකි. ප්‍රභාකරන්ට විරුද්ධ ව දෙමළ කණ්ඩායම් සටන් කර ඇති හෝ බිහි වී ඇති හෝ ප්‍රථම අවස්ථාව මෙය නොවේ. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීන්ගේ, ඔවුන්ගේ මෙරට නියෝජිතයන් වූ රාජ්‍ය නොවන සංවිධානවල ඊනියා බුද්ධිමතුන්ගේ හා කතෝලික මෙන් ම ක්‍රිස්තියානි පල්ලිවල ද ආධාරයෙන්, අනුග්‍රහයෙන් හා ආශිර්වාදයෙන් ප්‍රභාකරන් දෙමළ ජනතාවගේ එකම නියෝජිතයා ලෙසත් අනභිබවනීය යුද්විරුවකු ලෙසත් පුම්බා තිබුණි නමුත් ඔහු කරුණා කැරලි ගසනවින විට ඉතා දුර්වල තත්ත්වයකට ඇද වැටී තිබුණි. ඔහුට අඩුතරමින් ආනන්ද සංගරී මහතාට විරුද්ධ ව කිසිවක් කරකියාගත නොහැකි වී තිබුණි.

හැටේ දශකයේ ප්‍රභාකරන් හා එවැනි තවත් දෙමළ ජාතිවාදීන් බිහි වූ යුගයේ විවිධ කණ්ඩායම් ප්‍රභාකරන්ගේ කණ්ඩායම සමග සටන් වැදුණි. උමා මහේෂ්වරන් කණ්ඩායම එහි දී ප්‍රධාන විය. ඔවුහු ඉන්දියාවේ චෙන්නායි නගරයේ දී පවා එකිනෙකා සමග සටන් වැදුණහ. එහෙත් ක්‍රම ක්‍රමයෙන් ප්‍රභාකරන් කණ්ඩායම බලවත් විය. එයට එක් හේතුවක් වූයේ විජාතික  බලවේගවලින් ප්‍රභාකරන්ට ලැබුණු සහයෝගය ය. මෙරට දෙමළ ජාතිවාදය, ආරම්භයේ සිට ම ලංකාවට පමණක් සීමා වූ ප්‍රශ්නයක් නොවී ය. ලන්දේසි යුගයේ සිට ම බටහිරයෝ දෙමළ ජාතිවාදය පෝෂණය කිරීමට කටයුතු කළහ. පසු කලෙක ඉන්දියාව ද ප්‍රශ්නයට අත පෙවී ය. ප්‍රභාකරන් බිහි කළ කොටි සංවිධානයට ඉන්දියාව කලක් අනුග්‍රහය දැක්වුව ද, පසුව එරට කොටින්ට විරුද්ධ විය. අසූවේ දශකයේ අග ඊ පී ආර් එල් එෆ් කණ්ඩායමට කොටි සමග සටන් කිරීමට හැකි වූයේ  ඉන්දියාවේ ආධාරයෙනි. මේ අවස්ථාවේ දී ද අප ඉන්දියාවේ කාර්යභාරය ගැන සැලකිලිමත් විය යුතු ය.

කෙසේ වෙතත් අද කරුණා සටන්කරන්නේ එක්තරා ආකාරයකින් ගත්කල උතුරු හා නැගෙනහිර පළාත්වල ම බලය විමධ්‍යගත කිරීම සඳහා ය. මේ සමග උතුරු හා නැගෙනහිර පළාත් සම්බන්ධයෙන් දෙමළ ජාතිවාදයේ අනුග්‍රහකයන් විසින් ගොඩනගා ඇති දෙමළ ඒකකයක් පිළිබඳ මතය ප්‍රායෝගිකව ම බිඳ වැටෙයි. මේ ඊනියා දෙමළ ඒකකය ඉන්දියාවේ තමිල්නාඩුව වැන්නක් නොවේ. එහි ඓතිහාසික හෝ ජනගහනය සම්බන්ධයෙන් හෝ කිසිම වැදගත්කමක් නැත. ඉංගිරිසින් විසින් අභිමත ව ඇතිකරන ලද පළාත් දෙකක් එකතුකර ඒ ඒකකය ගොඩනගන ලදී. එහෙත් මෙරට දෙමළ ජනයාගෙන් සියයට පනහකට වැඩි පිරිසක් ජීවත් වූයේ මේ පළාත්වලින් පිට ය. එමෙන් ම ඒ පළාත්වල ජනගහනයෙන් සැලකිය යුතු පිරිසක් දෙමළ නොවී ය. මුස්ලිම් ජනයා මේ ඊනියා දෙමළ ඒකකයට විරුද්ධ ව කටයුතු කර ඇති නමුත් දෙමළ ජනයා එයට විරුද්ධවන්නේ ප්‍රථම වතාවට ය. මින් පෙර ප්‍රභාකරන්ට දෙමළ ජනයාගෙන් ම මතු වූ විරුද්ධතාවන්ට නායකත්වය දුන්නේ යාපන සම්භවයක් ඇතියවුන් වුව ද මේ වතාවේ එය නැගෙනහිර පවරාගෙන ඇත.

උතුරේ හා නැගෙනහිර සමජාතිය දෙමළ පිරිසක් නැත. එසේ ඇත්තේ රාජ්‍ය නොවන සංවිධානවල උගතුන්ගේ ඔළුවල පමණ ය. උතුර හා නැගෙනහිර දෙමළ ජනයා කුල වශයෙන් බෙදී සිටිති. මුළු මහත් දෙමළ සමාජයේ ම තිබූ යාපන වෙල්ලාල හින්දු ආධිපත්‍යය බිඳ දැමීමට ප්‍රභාකරන් සමත් විය. මුල්කාලයේ දෙමළ නායකත්වය රාමනාදන්, අරුනාශලම්, කුමාරස්වාමි පවුලට හිමිවිය. එය ජී ජී පොන්නම්බලම් විසින් අභියෝගයට ලක්කෙරුණ ද නායකත්වය යාපන වෙල්ලාල හින්දු විය. මේ හින්දු නායකත්වය චෙල්වනායගම් විසින් බිඳ දමනු ලැබිණි. චෙල්වනායගම්ගෙන් පසුව දෙමළ ජාතිවාදයේ මතවාදී නායකත්වය ක්‍රිස්තියානි හා කතෝලික විය. එහෙත් ඒ බව සැඟවීමට දෙමළ ජාතිවාදයේ අනුග්‍රාහකයෝ උත්සාහ කළහ. ප්‍රභාකරන් විසින් වෙල්ලාල නායකත්වය ද බිඳ දමනු ලැබිණි. මේ එකක්වත් දෙමළ සමාජය විසින් ම ඇතිකරන ලද අභියෝග නොවී ය. ඒ සියල්ල පිටුපස විජාතික බලවේග විය. උතුරු හා නැගෙනහිර පළාත් එකක් ලෙස ලෝකයට පෙන්නුම් කළ ද ඒ පළාත් අතර තිබූ ගැටුම් එලෙස ම තිබුණි. අද මතු වී ඇත්තේ (සමහරවිට නැවත වරක් විදේශීය හස්තයක මැදිහත් වීමෙන්) මේ ගැටුම ය. එය යාපනයේ කුල ආධිපත්‍යයට එරෙහිව කෙරෙන අරගලයක් ද වෙයි. ප්‍රභාකරන් වෙල්ලාල නොවී කරෙයිවර කුලයට අයත්වීම එක්තරා ආකාරයකින් ගත්කල

© Prof. Nalin De Silva

මේ අරගලය මෙතරම් ප්‍රමාද කිරීමට හේතු විය. ප්‍රභාකරන් වෙල්ලාල කුලයට අයත් වී නම් මඩකලපු ජනයා ඔහුට විරුද්ධ ව මෙයට කලින් අරගල කිරීමට තිබුණි.

උතුරු නැගෙනහිර යනුවෙන් ඒකකයක් නැති බව කරුණාගේ අරගලයෙන් කියැවෙන ප්‍රධාන ම කරුණ වෙයි. මෙතෙක් දෙමළ ජාතිවාදීන් විසින් සඟවා තිබුණු දෙමළ ජනවර්ගයේ සජාතීය නොවන බව දැන් නැවත වරක් එළියට පැන ඇත. ඒ අතර උතුර හා නැගෙනහිර ඒකකයට බලය විමධ්‍යගත කළ යුතු ය යන බොරු විසඳුමේ මිථ්‍යාව ද ඒ සමග පුපුරා යයි. අද කරුණා ඉල්ලා සිටින්නේ මේ ඒකකයෙන් නැගෙනහිර පළාතට බලය විමධ්‍යගතකරන ලෙස ය. උතුරු නැගෙනහිර යනුවෙන් ඒකකයක් නිර්මාණය කර ඇත්තේ සිංහලත්වයට එරෙහිව පහර ගැසීමට හා රට දෙකඩ කිරීමට මිස එසේ සජාතීය ජනවර්ගයක් ජීවත්වන ප්‍රදේශයක් ඓතිහාසික ව හෝ ජනගහන බෙදීම අනුව හෝ ඇති නිසා නොවේ. ඒ සමග දෙමළ ජාතිවාදයට ඊනියා විසඳුමක් ලෙස ඉදිරිපත්කරන බලය විමධ්‍යගතකිරීම ද බිඳ වැටෙහි. කරුණා ගුරු කොටගෙන විවිධ ප්‍රාදේශීය කණ්ඩායම් තව තවත් කුඩා ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට කියනු ඇත. තොණ්ඩමන් පමණක් නොව ප්‍රාදේශීය මුස්ලිම් නායකයන්ට ද තම තමන්ගේ කුඩා අධිරාජ්‍ය ගොඩනගාගැනීම සඳහා බලය විමධ්‍යගතකරන ලෙස ඉල්ලා සිටිනු ඇත.

මෙරට බලය, එනම් ව්‍යවස්ථාදායක බලය, ඓතිහාසික වශයෙන් බෙදී නැත. මුළුමහත් ඉතිහාසයෙහි ම රට එක්සේසත් කිරීම සඳහා සටන්වැදීමට සිදු වී ඇත්තේ අවස්ථා කිහිපයක දී පමණ ය. ඉන් කියැවෙන්නේ බොරු වම හා බොරු ප්‍රබුද්ධයන් කියන ආකාරයට රට එක්සේත් ව පැවතී ඇත්තේ කෙටිකාලයක් තුළ පමණක් ය යන්න නොවේ. එක්සේසත්කිරීමට සිදු වී ඇති අවස්ථා ප්‍රමාණය අඩු වීමෙන් පෙන්නුම් කරන්නේ එක්සේසත් නොවී ප්‍රාදේශීය නායකයන් කුඩා පාලන ප්‍රදේශ ඇතිකරගෙන තිබූ යුග ඉතා අඩු වූ බව ය. අනෙක් කාලවල දී රට එක්සේසත් හෙවත් ඒකීය විය. කසිකබල් බුද්ධිමතුන් කියන ආකාරයට නම් ඒකීය යන්න බ්‍රිතාන්‍යන්ගේ නිර්මාණයකි. ඒ ඔවුන් යුරෝපීය හා බටහිර කෝණයකින් ලෝකය දෙස බලන බැවිනි. ඒකීය හෙවත් යුනිටරි යන සංකල්පය දුටුගැමුණු රජතුමා නොදැන සිටින්නට ඇත. එහෙත් එතුමා කසිකබල් උගතුන්ට හා ඔවුන්ගේ සුදු ස්වාමීන්ට පෙර එක්සේසත් යන සංකල්පය දැන සිටියේ ය. සුද්දන්ගේ මතවාද සිංහලත්වයට එරෙහිව සතිඅන්ත පත්තර කඩමාල්ලක වැමෑරීම තම විනෝදාංශය කරගෙන සිටින වඳ අනුකාරකයෙක් අපට ගල්යුගයේ චින්තකයන් යැයි කියා තිබෙනු දුටුවෙමි. මේ ඊනියා නූතන අනුකාරකයන්ගේ වඳ දේශපාලන විද්‍යාවට එක්සේසත් යන වචනය ඇතුලත් කර නොගන්නේ සංකල්ප බිහිකිරීම බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ප්‍රවේණියක් ලෙස ඔවුන්ගේ ස්වාමීන් ඔවුන්ට උගන්වා ඇති බැවිනි. ජීවිතයේ කිසි දිනක සංකල්පයක් ප්‍රවාදයක් නිර්මාණය කර නැති පුස්සන්ට තේරෙන චින්තනයක් නැත. ඔවුහු චින්තනය යන සංකල්පය තබා ඔවුන්ගේ ස්වාමියකු වූ තොමස් කූන් නිර්මාණය කළ සුසමාදර්ශය (පැරඩයිම්) යන සංකල්පය වත් නොදනිති. කොකා කෝලාවලින් පෙප්සිකෝලාවට මාරුවීමත් ඔවුන්ට සුසමාදර්ශ වෙනසකි.

බටහිරයන් සහ ගැත්තන් විසින් නිර්මාණය කරන ලද ප්‍රභාකරන් නම් ඊනියා මහා පුරුෂයා ද නැති බව දැන් පැහැදිලි ය. ප්‍රභාකරන් නමින් අනභිබවනීය යුද්ධයෙහි දක්ෂ පුද්ගලයකු බිහිකරනු ලැබුයේ බටහිර ජනමාධ්‍ය විසිනි. මෙරට අනුකාරක ජනමාධ්‍යවේදීහු ද එයට පොහොර දැමූහ. මර්වින් ද සිල්වා මහතා විසින් සංස්කරණය කෙරුණු ලංකා ගාඩියන් සඟරාවට ප්‍රභාකරන් දශකයේ පුරුෂයා විය. එහෙත් කරුණා, ප්‍රභාකරන් කවුදැයි හෙළිදරව් කර ඇත. තම ආධිපත්‍යය සඳහා නැගෙනහිර පළාතේ දෙමළ ජනයා බිලි දී ඇති ප්‍රභාකරන් නිවටයකු බව දැන් පැහැදිලි ය. එපමණක් නොවේ. කරුණාට අනුව එක්සත් ජනතා නිදහස් සන්ධානය බලයට පත්වුවහොත් යුද්ධ කිරීම සඳහා ප්‍රභාකරන් දහසක පිරිසක් නැගෙනහිරින් ඉල්ලා ඇත. මෙය ඉතා භයානක කරුණකි. ප්‍රභාකරන්ට අවශ්‍ය වන්නේ එ ජා පෙ ආණ්ඩුවකි. ඒ සැලැස්ම පිටුපස සිටින්නෝ කවරහු ද? ඒ දැනගැනීම එතරම් අපහසු කරුණක් නොවේ. ප්‍රභාකරන් හා කරුණා අතර ගැටුම අවසන් කිරීමට කටයුතු කරන්නේ ද මේ පිරිස ම ය.

අද ප්‍රභාකරන් හා කරුණා අතර ඇති ගැටුම සංසිඳවීමට මහන්සිවන්නෝ කවරහු ද? බ්‍රිතාන්‍ය මහා කොමසාරිස්වරයා කිලිනොච්චියට ගියේ අහවල් දෙයකට ද? මේ මහා කොමසාරිස්ලාට හා තානාපතියන්ට මේ රටේ දේශපාලනයට මෙතරම් ඇඟිලිගැසීමට හැකි වී ඇත්තේ ම නායකයන් යැයි කියාගන්නවුන්ගේ නිවටකම නිසා ය. ජී එල් පීරිස් අද සිංහල දේශපාලනඥයන්ට ප්‍රභාකරන් කරුණා ගැටුමට මැදිහත් නොවන ලෙස කියයි. එහෙත් ඔහුගේ ආණ්ඩුව තානාපතිවරුන්ට හා සොල්හයිම්ලාට ප්‍රභාකරන් හා කරුණා මුණගැසීමට අවසර දෙයි. පිරිස් නැති පීරිස් රැකෙන්නේ

© Prof. Nalin De Silva

සුද්දන්ට පින්සිඳුවන්නට ය. ඔහු කියන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වලට මැදිහත්විය යුත්තේ සුද්දන් හා දෙමළ ජාතිවාදීන් පමණක් බව ය. ප්‍රභාකරන් හා කරුණා සමගි කිරීමට වෑයම් ගන්නා අනෙක් පිරිස කතෝලික හා ක්‍රිස්තියානි පූජකවරු ය. වැඩිකල් නොගොස් රාජ්‍ය නොවන සංවිධානවල ඊනියා ගැටුම් නිරාකරණ පුද්ගලයන් ද මේ ක්‍රියාවලට සහභාගිවනු ඇත. ගැටුම් නිරාකරණය කිරීම වරදක් දැයි කිසිවකු විසින් අසනු ලැබීමට ඉඩ ඇත. මෙහි දී ප්‍රශ්නය වනුයේ මේ ගැටුම් නිරාකරණය කරන්නේ කවු ද කුමක් සඳහා ද යන්න ය. මේ ගැටුම් නිරාකරණය කරන්නෝ හා ඔවුන්ගේ මුතුන් මිත්තෝ ලංකාවේ දෙමළ ජාතිවාදය නිර්මානය කළහ. එය නඩත්තු කළහ. ගැටුම නිර්මානය කළෝ ඔවුහු ය. මේ ගැටුම අන්කිසිවක් නොව සිංහලයන්ට එරෙහිව මෙරට විවිධ ජනවර්ග සංවිධානය කිරීමෙන් පැනනැගුණු එකක් වෙයි. ඔවුන්ට ඇති ගැටුම එය මිස අන් කිසිවක් නොවේ. දැන් ප්‍රශ්නය වී ඇත්තේ ප්‍රභාකරන් කරුණා අරගලය අර කලින් කී ගැටුමට බාධාවක්  වීම ය. එබැවින් සිංහලත්වයට විරුද්ධ ව ගැටුම ඉදිරියට ගෙන යෑමට ප්‍රභාකරන් කරුණා අර්බුදය විසඳීමට ඔවුහු ඉදිරිපත් වෙති. ඒ මිස එය ගැටුම් නිරාකරණයක් නොවේ.

ප්‍රභාකරන් දෙමළ ජනතාව තම ආධිපත්‍යයට හසුකරගෙන ඇත්තේ බටහිරයන්ගේ හා ඔවුන්ගේ ගෝලබාලයන්ගේ ආධාරයෙනි. සිංහලයන්ගෙන් දෙමළ ජනයාට වී ඇති අසාධාරණයක් ගැන මිථ්‍යාවක් මවා බ්‍රිතානි ක්‍රිස්තියානි යටත්විජිතවාදීහු දෙමළ ජාතිවාදය බෞතීස්ම කළහ. අද දෙදරමින් පවතින්නේ මේ ආධිපත්‍යය ය. ඒ ආධිපත්‍යය පිපිරවීමට අකමැති තවත් පිරිසක් ද වෙති. ඒ එක්සත් ජාතික පෙරමුණේ නායකයෝ වෙති. ඔවුන් බලා සිටියේ කොටින්ගේ අනුග්‍රහයෙන් දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු සමග ආණ්ඩුවක් පිහිටුවීමට ය. අද ඒ බලාපොරොත්තුව සිහිනයක් පමණක් බවට පත් වී ඇත. ඒ ජා පෙ නායකයන්ට ද ප්‍රභාකරන් කරුණා සමගි කිරීමේ අවශ්‍යතාව ඇත. ඔවුන් ඒ කොන්ත්‍රාත්තුව භාර දී ඇත්තේ ද තම ස්වාමීන් වූ සුද්දන්ටම ය.  ඒ ජා පෙරමුණට ප්‍රභාකරන්ගේ ටී එන් ඒ මන්ත්‍රීන්ගේ ආධාරයෙන් මෙන් ම සිංහල ප්‍රභාකරන්ගේ උගුල් ඇටවීම් හරහා ද ආණ්ඩුවක් පිහිටුවීමට අවශ්‍ය වී ඇත.

ප්‍රභාකරන්ට තවදුරටත් දෙමළ ජනයාගේ එකම නියෝජිතයා ලෙස පෙනී සිටිය නොහැකි ය. දෙමළ ජනයා මෙතෙක් ප්‍රභාකරන්ගේ ආධිපත්‍යයට යට වී සිටි නමුත් තවදුරටත් ඒ නො ඉවසති. ප්‍රභාකරන් දෙමළ ජනයාගේ ඊනියා එකම නියෝජිතයා බවට පත්වූයේ ප්‍රජාතන්ත්‍රවාදී හෝ ජනසම්මතවාදී ක්‍රමයකට නොව තුවක්කුවේ බලයෙනි. එහෙත් ප්‍රභාකරන් එක්වර අල්තාරයෙන් බැසයාවි යැයි නො සිතිය යුතු ය. අල්තාරයට අරක්ගත් පූජකයන් ඔහුට එසේ බැස යෑමට ද ඉඩ නොදෙනු ඇත. ඒ කෙසේ වෙතත් ප්‍රභාකරන් මිථ්‍යාව පුපුරුවා හැරීම සිංහල ප්‍රභාකරන්ට ද පාඩමකි. ව්‍යාජ සංඝ ආඥා හා විද්‍යාලංකාර ප්‍රකාශය කණපිට හරවන දේශපාලනයක් මගින් සිංහලයේ උරුමය තමන්ට පමණක් ඇතැයි කියන අවස්ථාවාදීන්ට ද කිවයුත්තේ ජනතාවගේ එකම නියෝජිතයන් කියා පිරිසක් නැති බව ය. අද සිංහලයන් අතර දේශපාලනය කරන්නන් කළ යුත්තේ කුමක් ද? දෙමළ ජනයා අද අසරණ වී ඇත. ඔවුන්ට අද කිසිම නායකත්වයක් නැත. කරුණාට ද දෙමළ ජනයා කෙරෙහි කරුණාවක් නැත. සිංහලයන් ගැන ඔහුගේ ඇති කරුණාව ගැන කියනුම කවරේ ද? දෙමළ ජනයාට මේ සමස්ත දෙමළ ජාතිවාදී දේශපාලනයේ ඇති ව්‍යාජත්වය දැනගැන්වීමට සැලැස්වීමට මේ කාලය වෙයි. බොරුව හා බොරුව පමණක් මත පදනම් වූ දෙමළ ජාතිවාදය පරාජය කළ යුතු ය. එය පරාජය කළ හැකි ය. එහෙත් ඒ සඳහා ප්‍රශ්නය හඳුනාගත යුතුව ඇත. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ඇති ප්‍රශ්නයක් නැත. ප්‍රශ්න ඇතිකර ඇත්තේ රාමනාදන්ලාගේ සිට ඇති ප්‍රභාකරන්ගේ සීයලා බාප්පලා හා මස්සිනලා විසිනි. ප්‍රශ්නය පටන්ගත්තේ මෙළ ජාතිවාදීන් බ්‍රිතානීන්ගේ සහාය ඇතිව මධ්‍යයේ නායකයන් බවට පත්වීමට උත්සාහ කිරීම හරහා ය. ප්‍රභාකරන්ගේ සීයලාට මධ්‍යයේ නායකයන් වීමට බැරි වූ විට ප්‍රභාකරන්ගේ බාප්පලා මධ්‍යයේ පනහට පනහ ඉල්ලුහ. එය ද බැරි වූ විට එක් බාප්පා කෙනෙක්වූ චෙල්වනායගම් වෙන ම රාජ්‍යයක් ඉල්ලා සටන් ආරම්භ කෙළේ ය. ප්‍රභාකරන් හා ඔහුගේ මස්සිනාලාට අවශ්‍ය වෙන ම රාජ්‍යය සාක්ෂාත් කරගැනීම ය.

දෙමළ ජාතිවාදයට විසඳුම එය පරාජය කිරීම ය. එහෙත් එහි දී අප රටට ගැලපෙන ආණ්ඩුක්‍රමයක් සකස්කරගැනීමේ අවශ්‍යතාව ද වෙයි. ඒ සඳහා ආකෘති නැතිවා නොවේ. බලය බෙදීමක් නොකර වෙස්ට්මිනිස්ටර් ක්‍රමය ද ඉවත ලා ඉතිහාසයට හා වර්තමානයට අනුකූල ව එකසේසත් (ඒකීය) රාජ්‍යයක් පිහිටුවා  ගත යුතු ය. ඒ රාජ්‍යය පිහිටුවීමේ දී සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි විශේෂත්වය පිළිගත යුතු ය. පළාත් නැවත බෙදා එහි සංවර්ධනය සඳහා මෙන් ම ජාතික වශයෙන් වැදගත් වූ අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි විෂය සඳහා ද රාජ්‍ය සභාවෙහි (පාර්ලිමේන්තුවෙහි) විශේෂ කමිටු පිහිටුවිය යුතු ය. ඒ කමිටුවල  දෙමළ මුස්ලිම් මන්ත්‍රීවරු ද සිටිය යුතු ය. නාගදීපය (දළ වශයෙන් උතුරු

පළාත) සඳහා වූ කමිටුවේ සභාපති දෙමළ ජනවර්ගයට අයත්විම අනිවාර්ය නොවුණ ද එසේ විය හැකි ය. අද පනස්හයේ දරුවන්ගේ කාර්යභාරය වනුයේ ප්‍රභාකරන් හෝ කරුණා හෝ මාර්ගයෙන් නොව සෘජුව ම දෙමළ ජනයාට කතා කිරීම ය.

© Prof. Nalin De Silva